# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2004 අංක 11 දරන මුදල් පනත

---

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 28 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

2004 ඔක්තෝබර් මස 29 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 16.25 යි. තැපැල් ගාස්තුව : රු. 7.50 යි

# 2004 අංක 11 දරන මුදල් පනත

[සහතිකය සටහන් කළේ 2004 ඔක්තෝබර් මස 28 වන දින.]

එල්. ඩී.–ඕ. 24/2004

**2004 අයවැය යෝජනාවලට ආනුෂංගික ඇතැම් ගාස්තු හා බදු පැනවීම සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ හා ඊට ආනුෂංගික කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2004 අංක 11 දරන මුදල් පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

1 වන කොටස

## ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම

**2.** (1) (මේ පනතෙහි මෙහි මින්මතු "අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා, සෑම තැනැත්තකු හා සෑම හවුල් ව්‍යාපාරයක් විසින් ම, මේ පනතේ උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයට ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා, ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරය යටත් වන්නා වූ පිරිවැටුමේ සෑම කොටසක් සම්බන්ධයෙන්ම, මේ පනතේ විධිවිධානවලට යටත්ව (මෙහි මින්මතු "සේවා ගාස්තුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආර්ථික සේවා ගාස්තුවක් අයකළ හැකි විය යුතුය : ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම.

එසේ වුවද, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ආයෝජන මණ්ඩල ව්‍යවසායක් වන අවස්ථාවක, 2004 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන අදාළ තක්සේරු වර්ෂය සඳහා කිසිම සේවා ගාස්තුවක් අයකරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් අයකළ හැකි සේවා ගාස්තුව, ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ පිරිවැටුම රුපියල් මිලියන පනහ ඉක්මවන්නේ නම් පමණක් අය කරනු ලැබිය යුතු ය ;

එසේ වුව ද, යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයකින් අයකළ හැකි සේවා ගාස්තුව කිසිදු අවස්ථාවක දී රුපියල් මිලියන පනහ නොඉක්මවිය යුතු ය.

(3) මේ වගන්තියෙහි—

"යටත් විය හැකි පිරිවැටුම" යන්නෙන්, යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයක හා යම් තක්සේරු වර්ෂයක, අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ශ්‍රී ලංකාව තුළ අනුයෝජිතයකු හෝ අනුයෝජිතයන් වැඩි ගණනක් මගින් කරගෙන යන හෝ ක්‍රියාත්මක කරන ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින්, නැතහොත්, වෙනත් යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්, ඒ අදාළ තක්සේරු වර්ෂයේ ප්‍රථම දිනයට පෙරාතුව ම වූ මාස තිස් හයක කාලපරිච්ඡේදය ඇතුළත වූ යම් දිනයක, වාණිජ කටයුතු ආරම්භ කරනු ලැබුවා වූ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක්, සෑම වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක, අදාළ තක්සේරු වර්ෂයක පෙරාතුව ම තක්සේරු වර්ෂය සඳහා වූ මුළු පිරිවැටුම අදහස් වේ.

"පිරිවැටුම" යන්නෙන්, යම් වෙළෙඳාමකට, ව්‍යාපාරයකට, වෘත්තියකට හෝ රක්ෂාවකට හා යම් තක්සේරු වර්ෂයකට අදාළව, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ඒ වෙළඳාම, ව්‍යාපාරය, වෘත්තිය හෝ රක්ෂාව කරගෙන යාමේ දී ඒ තක්සේරු වර්ෂය තුළ ඇතුළත් වූ සෑම ගණුදෙනුවකින්ම පහත දැක්වෙන මුදල් අඩු කිරීමෙන් පසුව, ලැබුණ ද නොලැබුණ ද එහෙත් ලැබිය යුතු වන මුළු මුදල් ප්‍රමාණය අදහස් වේ. එම ලැබිය යුතු මුළු මුදල් ප්‍රමාණය කලින් වූ යම් තක්සේරු වර්ෂයක දී කපා හරින ලද හෝ ඉවත් කරන ලද යම් බොල් ණයක් වෙනුවෙන් ඒ තක්සේරු වර්ෂය තුළදී ලැබුණු යම් මුදල් ප්‍රමාණයකින් වැඩි විය යුතුය,–

(i) ඒ වෙළෙඳාම, ව්‍යාපාරය, වෘත්තීය හෝ රක්ෂාව කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය ඒ ගණුදෙනුව කරන අවස්ථාවේ දී, 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 10 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇත්නම් පමණක්, ඒ ගණුදෙනුව සම්බන්ධයෙන් එකතු කළ අගය මත බද්ද නියෝජනය වන මුදලක් වන, ඒ මුළු මුදලට ඇතුළත් යම් මුදලක් ;

(ii) දේශීය ආදායම් පනතේ 23 වන වගන්තිය යටතේ ක්ෂය වීම් සඳහා දීමනාවක් ප්‍රදානය කර ඇති යම් ප්‍රාග්ධන වත්කමක් බැහැර කිරීමෙන්, ලත් මුළු මුදල ; සහ

(iii) කලින් වූ යම් තක්සේරු වර්ෂයක යම් වෙළෙඳාමක ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක යටත් වූ පිරිවැටුමට ඇතුළත් කර ඇත්තා වූ අදාළ ඒ වෙළඳාමට ව්‍යාපාරයට, වෘත්තියට හෝ රක්ෂාවට දැරීමට සිදුවූ බොල් ණය ප්‍රමාණය :

එසේ වුව ද,

(අ) බැංකුවක් සම්බන්ධයෙන් වන විට, පොලිය, වට්ටම්, ලාභාංශ, විනිමය, සේවා ගාස්තු කොමිස් මුදල් තැරව් ගාස්තු සහ බැංකුවේ ව්‍යාපාරික ක්‍රියාමාර්ග වලදී බැංකුවට උපදින වෙනත් යම් ආදායම් වශයෙන් හෝ හේතුවෙන් ඒ බැංකුවේ ලැබීම්, ඒ බැංකුවේ පිරිවැටුමට ඇතුළත් ලෙස සැලකිය යුතු ය ; තව ද

(ආ) රක්ෂණ ව්‍යාපාරය කරගෙන යන යම් තැනැත්තෙක් සම්බන්ධයෙන් වන විට, ලැබුණු රක්ෂණ වාරික හෝ ලැබිය යුතු රක්ෂණ වාරික

(i) ජීවිත රක්ෂණ ; සහ

(ii) වැඩ වර්ජන, කැරලි කෝලාහල, ජන කැළඹීම් හෝ ත්‍රස්ත ක්‍රියා හේතුවෙන් අලාභ හානි හෝ විනාශවීම් පිළිබඳ රක්ෂණ සඳහා ඒකාබද්ධ අරමුදලට ගෙවන ලද රක්ෂණ

ඒ රක්ෂණ ව්‍යාපාරයේ පිරිවැටුමට ඇතුළත් නොවන ලෙස සැළකිය යුතු ය.

අදාළ ආදායම් බද්දෙන් සේවා ගාස්තුව හිලව් කළ යුතු බව.

**3**. (1) යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවන ලද යම් සේවා ගාස්තුවක ප්‍රමාණය, (මෙහි මින්මතු "පළමුවෙන් සඳහන් කළ අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අදාළ ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියට අනුකූලව සේවා ගාස්තුව අඩු කිරීමෙන් පසුව ශේෂයක් වෙතොත්, එය (මෙහි මින්මතු "පළමුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය" යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුවෙන් සඳහන් කළ අදාළ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු අදාළ ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තියට අනුකූලව අඩු කිරීමෙන් පසුව, ඒ සේවා ගාස්තුවේ ශේෂයේ ඉතිරි කොටසක් වෙතොත්, එය, (මෙහි මින්මතු දෙවනුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂය යනුවෙන් සඳහන් කරනු ලබන) පළමුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂයට පසුවම එළඹෙන අදාළ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු අදාළ ආදායම් බද්දෙන් අඩු කරනු ලැබිය යුතු ය.

(4) කිසිම අවස්ථාවක දී,—

(අ) මුළු අඩුකිරීම් ඒ සේවා ගාස්තු ප්‍රමාණය නොඉක්මවිය යුතු ය ; සහ

(ආ) (3) වන උපවගන්තියට අනුකූලව අඩු කිරීමෙන් පසුව, (3) වන උපවගන්තියේ සඳහන් අවශේෂයේ ඉතිරි කොටසක් වෙතොත්, එය, දෙවනුව එළඹෙන අදාළ තක්සේරු වර්ෂයට පසුව එළඹෙන යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා වූ යම් ආදායම් බද්දකින් අඩු කරනු ලැබිය යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා සහ යම් තැනැත්තකුට හෝ හවුල් ව්‍යාපාරයකට සහ යම් අදාළ තක්සේරු වර්ෂයක් සම්බන්ධයෙන් වන විට,-

"ගෙවිය යුතු අදාළ ආදායම් බද්ද" යන්නෙන්, ඒ අදාළ තක්සේරු වර්ෂයේ පළමු දිනට පෙරාතුව ම වූ මාස තිස් හයක කාල පරිච්ඡේදය ඇතුළත් වූ දිනයක, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් හෝ නැතහොත්, වෙනයම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් වාණිජ කටයුතු ආරම්භ කරන ලද්දා වූ යම් වෙළෙඳාමක්, ව්‍යාපාරයක්, වෘත්තියක් හෝ රක්ෂාවක් හැර එම තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන සෑම වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින් හෝ රක්ෂාවකින් අදාළ තක්සේරු වර්ෂය සඳහා එම තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුළු

ව්‍යවස්ථාපිත ආදායම මත වූ දඩ මුදල අදහස් වේ. ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ගෙවිය යුතු මුළු ආදායම් බදු ප්‍රමාණයට, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුළු ව්‍යවස්ථාපිත ආදායම වේ. තව ද, ගෙවිය යුතු මුළු ආදායම වෙන් වූ එම සමානුපාතයට ඒ ආදාළ තක්සේරු වර්ෂය සඳහා වූ ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ මුළු ව්‍යවස්ථාපිත ආදායම වන්නේ ය ; සහ

"ගෙවිය යුතු මුළු ආදායම් බද්ද" යන්නෙන්, දේශීය ආදායම් පනතේ උචිත උපලේඛනයෙහි නියමිත ආදායම් බදු අනුප්‍රමාණය, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තාගේ හෝ හවුල් ව්‍යාපාරයේ බදු අයකළ හැකි ආදායම සම්බන්ධයෙන් අදාළ කිරීම මගින් නිශ්චය කරගත් මුදල අදහස් වේ.

සේවා ගාස්තුවේ ඉතිරි කොටස ආපසු නොදිය යුතු බව.

**4**. යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, **3** වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) අනුඡේදයෙහි සඳහන් සේවා ගාස්තුවේ කොටස ආපසු නොදිය යුතු ය.

අයකළ හැකි බව පිළිබඳ දැන්වීම.

**5**. යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා සේවා ගාස්තුව අයකළ හැකි සෑම තැනැත්තකු හා සෑම හවුල් ව්‍යාපාරයක් විසින්ම, ඒ අදාළ වර්ෂයේ ජූනි මස පළමුවන දිනට පෙර කොමසාරිස් ජනරාල්වරයා අමතන ලද ලියවිල්ලකින් වූ දැනුම් දීමක් මගින් ඒ අයකළ හැකි වීම පිළිබඳව දැනුම් දිය යුතු ය. ඒ නිවේදනයෙන්, අවස්ථාවෝචිත පරිදි, කොමසාරිස් ජනරාල්වරයා විසින් ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නියම කරනු ලැබිය හැකි ආදායම් බදු ලිපිගොනු අංකය හෝ පෞද්ගලික හඳුනා ගැනීමේ අංකය හෙළි කළ යුතු ය :

එසේ වුව ද, 2004 අප්‍රේල් මස 1 වන දිනෙන් ආරම්භ වන අදාළ තක්සේරු වර්ෂය සම්බන්ධයෙන් වන විට, මේ පනත ක්‍රියාත්මක වීමේ දින සිට දින තිහක කාල පරිච්ඡේදයක් ඇතුළත ඒ දැනුම්දීම කරනු ලැබිය යුතු ය.

සේවා ගාස්තුව ත්‍රෛමාසික වාර කොටස් හතරකින් ගෙවිය යුතු බව.

**6**. යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා, යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ගෙවිය යුතු සේවා ගාස්තුව, තක්සේරුකරුවකු විසින් ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය පිළිබඳව කිසිදු තක්සේරුවක් කර නොමැත්තේ වුව ද, ඒ අදාළ තක්සේරු වර්ෂයේ ජූනි මස තිස්වන දින, සැප්තැම්බර් මස තිස්වන දින, දෙසැම්බර් මස තිස්එක්වන දින සහ මාර්තු මස තිස්එක්වන දින හෝ ඊට පෙර, ත්‍රෛමාසික වාර කොටස්

හතරකින්, කොමසාරිස් ජනරාල් වරයා වෙත, ඔහු විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට ගෙවනු ලැබිය යුතු ය. එවැනි එක් එක් ත්‍රෛමාසික වාර කොටස, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු සේවා ගාස්තුවෙන් හතරෙන් එක් කොටසක් විය යුතු ය :

එසේ වුව ද, 2004 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව ආරම්භව 2004 ජුනි මස 30 වන දිනෙන් අවසන් යම් කාලසීමාවක් සඳහා දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා ට යම් මුදලක් ගෙවීමට යටත් ව සිටින්නා වූ සහ 5 වන වගන්තියේ අතුරු විධානයේ විධිවිධාන අදාළවන්නා වූ යම් තැනැත්තකු විසින් එම මුදල 2004 සැප්තැම්බර් මස 30 වන දින හෝ ඊට ප්‍රථම ගෙවනු ලැබුවහොත්, ඒ තැනැත්තා මේ වගන්තියේ විධිවිධාන අනුව ක්‍රියා කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.

යටත්විය හැකි පිරිවැටුම පිළිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම.

7. යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා සේවා ගාස්තුව ගෙවිය යුතු සෑම තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින් ම, තක්සේරුකරුවකු විසින් නියම කරනු ලැබුව ද නොලැබුව ද, ඒ අදාළ තක්සේරු වර්ෂයේ අවසන් දින හෝ ඊට පෙරාතුව, අවස්ථාවෝචිත පරිදි, ඔහුගේ හෝ එහි, යටත්විය හැකි පිරිවැටුම පිළිබඳව, කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියක් වූ යම් විස්තර ඇතුළත් වාර්තාවක් තක්සේරුකරුවකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එක් එක් වාරිකය සඳහා වූ වාර්තාවේ, සේවා ගාස්තුව ගණන් බැලීමේ පදනම හා මේ පනත යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි වෙනත් යම් විස්තර ද පෙන්නුම් කරනු ලැබිය යුතු ය.

වාර්තා තබාගත යුතු බව.

8. සේවා ගාස්තුව අයකළ හැකි සෑම තැනැත්තකු හා හවුල් ව්‍යාපාරයක් විසින්ම, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් කරගෙන යනු ලබන හෝ ක්‍රියාත්මක කරනු ලබන යම් වෙළෙඳාමක, ව්‍යාපාරයක, වෘත්තියක හෝ රක්ෂාවක ගනුදෙනු පිළිබඳ වාර්තාවක්, මේ පනතේ 7 වන වගන්තිය යටතේ ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඉදිරිපත් කරන ලද සේවා ගාස්තුවට යටත් විය හැකි පිරිවැටුම් වාර්තාව, සමග සැසඳීම පහසු කෙරෙන යම් ආකාරයකින් පවත්වාගෙන යනු ලැබිය යුතු ය.

තක්සේරුකරු විසින්, තක්සේරු කිරීම් කළ යුතු බව.

9. යම් අදාළ තක්සේරු වර්ෂයක් සඳහා සේවා ගාස්තුවට යටත්වන යම් තැනැත්තකු හෝ හවුල් ව්‍යාපාරයක් විසින්-

(අ) සේවා ගාස්තුව ගෙවා නොමැති බවට ; හෝ

(ආ) ඒ තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා සේවා ගාස්තුව වශයෙන් ගෙවිය යුතුව තිබූ මුදලට වඩා අඩුවෙන් වූ මුදලක් ගෙවා ඇතැයි,

තක්සේරුකරුවකුගේ මතය වන්නා වූ අවස්ථාවක, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා, ඔහුගේ මතය අනුව, ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් සේවා ගාස්තුව වශයෙන් ගෙවිය යුතුව තිබූ මුදල ඒ තක්සේරුකරු විසින් තක්සේරු කරනු ලැබිය හැකි අතර ලිඛිත දැන්වීමක් මගින්,

(අ) ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා, ඒ තැනැත්තා හෝ ඒ හවුල් ව්‍යාපාරය විසින් යම් සේවා ගාස්තුවක් ගෙවා නොමැති නම්, ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා එසේ තක්සේරු කරන ලද සේවා ගාස්තුවේ ප්‍රමාණය ; හෝ

(ආ) ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා සේවා ගාස්තු වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් ගෙවා ඇත්නම්, එසේ තක්සේරු කරන ලද සේවා ගාස්තු ප්‍රමාණය හා ඒ අදාළ තක්සේරු වර්ෂය සඳහා ඒ තැනැත්තා හෝ හවුල් ව්‍යාපාරය විසින් ඇත්ත වශයෙන්ම ගෙවන ලද සේවා ගාස්තු ප්‍රමාණය අතර වෙනස,

වහාම ගෙවන ලෙස ඒ තැනැත්තාට හෝ හවුල් ව්‍යාපාරයට නියම කරනු ලැබිය යුතු ය.

නොගෙවූ සේවා ගාස්තු පැහැර හරිනු ලැබූ ලෙස සැලකිය යුතු බව.

**10**. 6 වන වගන්තියෙහි නිශ්චිත පරිදි, ගෙවීම කිරීම සඳහා නිශ්චිතව සඳහන් කරනු ලැබ ඇති දින හෝ ඊට පෙර, ගෙවනු නොලැබූ සේවා ගාස්තුවේ යම් වාරිකයක් හෝ ඉන් යම් කොටසක් පැහැර හැරීමක් ලෙස සලකනු ලැබිය යුතු අතර, පැහැර හරිනු ලැබූ සේවා ගාස්තුව ගෙවීමට බැඳී සිටින යම් පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක හවුල්කරුවෙක්, සමාගමක හෝ රාජ්‍ය සංස්ථාවක් ඇතුළු වෙනත් යම් සංස්ථාගත මණ්ඩලයක අධ්‍යක්ෂවරයෙක් හෝ වෙනත් ප්‍රධාන නිලධරයකු පැහැර හරිනු ලැබ ඇති සේවා ගාස්තුව ගෙවීමට බැඳී සිටින සංස්ථාගත නොවූ මණ්ඩලයක යම් සාමාජිකයෙක් මේ පනතේ මේ කොටසේ කාර්යය සඳහා පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

2000 අංක 38 දරන දේශීය ආදායම් පනතේ ඇතැම් විධිවිධාන අදාළ විය යුතු බව.

**11**. දේශීය ආදායම් පනතේ XIX, XX, XXI, XXII, XXIII, XXIV, XXV, XXVI සහ XXVII වන පරිච්ඡේදවල පිළිවෙලින් අභියාචනා තක්සේරු කිරීම් වල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය, පැහැර හරින ලද බද්ද සහ එයට එකතු කරනු ලබන මුදල්, බදු අයකර ගැනීම, විවිධ කරුණු, ආපසු ගෙවීම, වැරදි සහ දණ්ඩන, පරිපාලනය හා පොදු කාරණාවලට අදාළ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව මේ පනත යටතේ පිළිවෙලින් අභියාචනා, තක්සේරු කිරීම්වල අවසානාත්මකභාවය සහ වැරදි වාර්තා සම්බන්ධයෙන් දණ්ඩනය පැහැර හරිනු ලැබූ සේවා ගාස්තුව සහ එයට එකතු කරනු ලබන මුදල්, සේවා ගාස්තු අයකර ගැනීම, විවිධ කරුණු ආපසු ගෙවීම, වැරදි සහ දණ්ඩන, පරිපාලනය හා පොදු කාරණා සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

අර්ථ නිරූපනය.

**12**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි-

"අනුයෝජිතයා, ක්ෂයවීම සඳහා වූ දීමනාව හා තක්සේරුකරු" යන්නට, දේශීය ආදායම් පනතෙහි ඒවාට දී ඇති, ඒ ඒ අර්ථයන්ම ඇත්තේ ය ;

"ආයෝජන මණ්ඩල ව්‍යවසාය" යන්නෙන්, ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ගිවිසුමකට ඇතුළත් වූ යම් ව්‍යවසායක් අදහස් වේ ;

"ව්‍යාපාරය", "ප්‍රාග්ධන වත්කම්", "කොමසාරිස් ජනරාල්වරයා", "බැහැර කිරීම" යන්නට, දේශීය ආදායම් පනතේ ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන්ම ඇත්තේ ය ;

"කොමසාරිස් ජනරාල්වරයා" සහ "නියෝජ්‍ය කොමසාරිස්වරයා" යන්නට, දේශීය ආදායම් පනතේ දී ඇති එම අර්ථයම ඇත්තේ ය ;

"දේශීය ආදායම් පනත" යන්නෙන්, 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත අදහස් වේ ;

"හවුල් ව්‍යාපාරය", "ලැබුණු මුදල්" සහ "ලාභ හෝ ආදායම" යන්නට, දේශීය ආදායම් පනතේ, ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන්ම ඇත්තේ ය ;

"තැනැත්තා" යන්නට, සමාගමක් හෝ පුද්ගල මණ්ඩලයන් ඇතුළත් වන නමුත්, ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනතේ අර්ථානුකූලව යම් ලියාපදිංචි කරන ලද සමිතියක් ඇතුළත් නොවේ ;

"ව්‍යවස්ථාපිත ආදායම", "බදු අයකල හැකි ආදායම", "වෙළෙඳාම" සහ "තක්සේරු වර්ෂය" යන්නට, දේශීය ආදායම් පනතේ ඒවාට දී ඇති ඒ ඒ අර්ථයන්ම ඇත්තේ ය.

මේ කොටස ක්‍රියාත්මක වන දිනය.

**13**. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධාන, 2004 අප්‍රේල් මස 01 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්යය සඳහා සලකනු ලැබිය යුතු ය.

(2) 2004 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වී, මේ පනත ආරම්භවීමේ දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය තුළ දී, පනතේ මේ කොටස ප්‍රකාර සේවා ගාස්තුව වශයෙන් කොමසාරිස් ජනරාල්වරයා විසින් යම් මුදල් ප්‍රමාණයක් එකතු කරනු ලැබ ඇති අවස්ථාවක, එසේ එකතු කරන ලද සේවා ගාස්තුව වලංගු ලෙස අයකරනු ලැබ, පනවා ඇති ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ සේවා ගාස්තුව එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩු පැවරීමේ වගකීමෙන් කොමසාරිස් ජනරාල්වරයා මෙයින් ආරක්ෂා කරනු ලැබිය යුතු ය.

## II වන කොටස

## සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක බද්ද පැනවීම

සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක බද්ද පැනවීම.

**14**. 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එක් එක් වර්ෂය සඳහා, (මෙහි මින්මතු "භාවිත කරන්නා" යනුවෙන් සඳහන් කරනු ලබන) සෙලියුලර් ජංගම දුරකථනයක් භාවිත කරන සෑම තැනැත්තකුගෙන්ම, එක් එක් මාසය සම්බන්ධයෙන්, ඒ සෙලියුලර් ජංගම දුරකථනය භාවිත කරන්නාට 15 වන වගන්තියේ, සඳහන් ජංගම දුරකථන ක්‍රියාකරු විසින් සේවා හෝ අනාගත සේවා සැපයීමේ අගය මත ගණන් බලන ලද සියයට දෙකහමාරක් වූ, (මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) සෙලියුලර් ජංගම දුරකථන ග්‍රාහක බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්ද හෝ බදු වශයෙන් පනවා අයකරනු ලැබේ :

එසේ වුව ද, 1996 අංක 9 දරන තානාපති වරප්‍රසාද පනතේ විධිවිධාන අදාළ වන කිසිම සංවිධානයක් හෝ පුද්ගලයකු විසින් ඉහත සඳහන් බද්ද ගෙවීම අවශ්‍ය නොවන්නේ ය.

මේ වගන්තියේ කාර්ය සඳහා "සැපයුමේ වටිනාකම" යන්නට 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ දී ඇති අර්ථයම ඇත්තේ ය.

බදු එකතු කිරීමේ ක්‍රමය.

**15**. 14 වන වගන්තිය යටතේ ගෙවිය යුතු බද්ද, 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් ජංගම දුරකථන ක්‍රියාකරුවන් විසින් එකතු කර, කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබිය හැකි යම් විස්තර ද සමඟ 2004 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන එක් එක් මස අවසානයේ පටන් දින පහළොවක් ඇතුළත, ඉහත කී පනත යටතේ පිහිටුවන ලද (මෙහි මින්මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

ආණ්ඩුව වෙනුවෙන් කොමිෂන් සභාව විසින් බදු එකතු කළ යුතු බව.

**16**. කොමිෂන් සභාව විසින් 15 වන වගන්තිය ප්‍රකාර එක් එක් මාසය සම්බන්ධයෙන් ආණ්ඩුව වෙනුවෙන් එකතු කරන ලද බද්ද, 15 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, බද්ද ලැබීමෙන් දින හතක් ඇතුළත ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

භාණ්ඩාගාර ලේකම් විසින් මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව.

**17**. ආණ්ඩුව වෙනුවෙන් බද්ද එකතු කිරීම හා ප්‍රේෂණය කිරීමට අදාළ මාර්ගෝපදේශ භාණ්ඩාගාර ලේකම් විසින් කලින් කල නිකුත් කරනු ලැබිය යුතු ය.

බද්ද ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවල දී ගත යුතු ක්‍රියා මාර්ගය.

**18**. (1) 14 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි, සේවා සැපයුමේ වටිනාකම මත අයවිය යුතු බදු ප්‍රමාණය ගෙවීමට අපොහොසත්වන යම් බලපත්‍රලත් ජංගම දුරකථන ක්‍රියාකරවන්නකු පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පැහැර හරින්නෙකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තවද, ඒ බද්ද, අයවිය යුතු දින හෝ ඊට පෙර නොගෙවූ පැහැර හරිනු ලැබූ බද්දක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) පැහැර හරින්නා, පැහැර හරින ලද බද්දට අතිරේකව,

(අ) 15 වන වගන්තිය යටතේ බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාලපරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දහය බැගින් ; සහ

(ආ) (අ) ඡේදයේ නිශ්චිතව සඳහන් කරන ලද බද්ද ගෙවිය යුතු දින පටන් එක් මසක් පසු වූ කාල පරිච්ඡේදයක් හෝ ඉන් යම් කොටසක් සඳහා අයවිය යුතු පැහැර හරින ලද බදු මුදලින් සියයට දෙක බැගින්,

ගණන් බලනු ලබන අධිභාරයක් ගෙවීමට ද යටත් විය යුතු අතර ඒ අධිභාරය කොමිෂන් සභාව විසින් එකතු කරනු ලැබිය යුතු ය.

(3) මාස තුනකට වැඩි කාල පරිච්ඡේදයක් පැහැර හැර ඇති යම් බද්දක්, ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමඟ මෙහි මින් මතු සඳහන් කරනු ලැබ ඇති ආකාරයට අය කර ගැනීම සඳහා කොමිෂන් සභාව ක්‍රියා කළ යුතු ය.

(4) පැහැර හැර ඇති බද්ද, ඒ මත එකතු වූ අධිභාර මුදල ද, සමඟ අය කර ගැනීමට පියවර කිසිවක් ගැනීමට සති තුනකට පෙරාතුව, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර, පැහැර හැර ඇති බදු මුදල අය කර ගැනීම සඳහා නඩු පැවරීමට අදහස් කරන බව පැහැර හරින්නා වෙත දැනුම් දෙමින් කොමිෂන් සභාව විසින් පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර පැහැර හරින්නා වෙත දැන්වීම නිකුත් කරනු ලැබ, ඒ දැන්වීමේ සඳහන් සති තුනක කාලපරිච්ඡේදය ඉකුත්වී ඇති නමුත්, අධිභාරය සමඟ පැහැර හැර ඇති මුදල නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ හෝ ව්‍යාපාරය කර ගෙන යන්නා වූ කොට්ඨාසය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත, පැහැර හරින්නාගේ නම හා ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුළත් සහතිකයක්, මේ වගන්තිය මගින් නියමිත ගෙවීම කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර හැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමඟ, කොමිෂන් සභාව විසින් සභාපතිගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සභාපතිගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සෑම අධ්‍යක්ෂවරයකුගේම නම සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුණු විට, නියම කරනු ලැබිය යුතු යම් දිනයක තමා ඉදිරියේ පෙනී සිට, පැහැර හරින ලද බදු මුදල, ඒ මත එකතු වූ අධිභාරය ද සමඟ අයකර ගැනීම සඳහා ඔහුට විරුද්ධව නීත්‍යානුකූලව කටයුතු නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැරහරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීමට හේතුව පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ යයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක, මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව, පැහැර හරින ලද බදු මුදල, ඒ මත එකතු වූ අධිභාරය ද සමඟ මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් සේ සලකා පැහැර හරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලැබූ මුදල් කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කර, එකී මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**19**. මේ පනතේ මේ කොටසේ විධිවිධාන, 2004 ජනවාරි මස 1 වන දින පටන් ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

වගකීමෙන් ආරක්ෂා කිරීම.

**20**. 2004 ජනවාරි මස 1 වන දිනයෙන් ආරම්භව, මේ පනත ආරම්භ වන දිනයෙන් අවසන් වන කාල පරිච්ඡේදය තුළ යම් බලපත්‍රලත් ජංගම දුරකථන ක්‍රියාකරුවකු විසින් යම් පාවිච්චි කරන්නකුගෙන් අය කර එකතු කරන ලද බදු මුදල් ප්‍රමාණය, එසේ වලංගු ලෙස අයකර ගනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීමේ වගකීමෙන්, ඒ ක්‍රියාකරු මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

## III වන කොටස

## ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද පැනවීම

ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද පැනවීම.

**21**. (1) ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවෙන් මේ වගන්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට (මෙහි මින්මතු "බලපත්‍ර ලාභියා" යනුවෙන් සඳහන් කරනු ලබන) මෙහෙයුම් කරගෙන යාම සඳහා බලපත්‍රයක් ලබාගන්නා සෑම තැනැත්තකුගෙන්ම එක් එක් ලිත් මාසයක් තුළ දී ලබාගන්නා එන සහ යන ජාත්‍යන්තර ඇමතුම්වල සම්පූර්ණ මිනිත්තු සංඛ්‍යාව සම්බන්ධයෙන් (මෙහි මින්මතු "ක්‍රියාකරු බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්දක් පනවා අයකරනු ලැබිය යුතු ය :

එසේ වුව ද, මේ වගන්තියේ කාර්ය සඳහා "ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු" යන්නෙන්, ජාත්‍යන්තර විදුලි සංදේශ සේවා සැපයීම සඳහා 1991 අංක 25 දරන ශ්‍රී ලංකා විදුලි සංදේශ පනතේ 17 වන වගන්තිය යටතේ බලපත්‍රලත් යම් ක්‍රියාකරුවකු අදහස් වේ :

එසේම තවදුරටත්, 2003 මාර්තු මස 3 වන දිනෙන් ආරම්භ වන කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු ක්‍රියාකරු බද්ද, 26 වන වගන්තිය යටතේ සාදන ලද නියෝග ක්‍රියාත්මක වන තුරු,—

(අ) 2003 මාර්තු මස 3 වන දිනයෙන් ආරම්භ වී, 2004 මාර්තු මස 31 වන දිනයෙන් අවසාන වන කාල පරිච්ඡේදය තුළ දී එන ජාත්‍යන්තර ඇමතුම පවත්නා කාලය සඳහා මිනිත්තුවකට එක්සත් ජනපද ඩොලර් ශත එකොළහ බැගින් හා යන ජාත්‍යන්තර ඇමතුම පවත්නා කාලය සඳහා මිනිත්තුවකට ශ්‍රී ලංකා රුපියල් හතරයි ශත හතලිහ බැගින්, සහ

(ආ) 2004 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන දෙවන වර්ෂය තුළ දී එන ජාත්‍යන්තර ඇමතුම පවත්නා කාලය සඳහා මිනිත්තුවකට එක්සත් ජනපද ඩොලර් ශත නවයක් බැගින් හා යන ජාත්‍යන්තර ඇමතුම පවත්නා කාලය සඳහා මිනිත්තුවකට ශ්‍රී ලංකා රුපියල් තුනයි ශත අනූව බැගින්

ගණන් බැලිය යුතු ය.

(2) ගෙවීම ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා යම් ගෙවීමක්, එක්සත් ජනපද ඩොලර් වලින් ශ්‍රී ලංකා රුපියල්වලට හැරවිය යුතු අවස්ථාවක, ගෙවීම කරන දිනයට කලින් දිනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලැබ ඇත්තා වූ හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ දැක්වෙන්නා වූ විකිණීමේ විනිමය අනුපාතය භාවිත කළ යුතු ය. පූර්ව කාලපරිච්ඡේද සම්බන්ධයෙන් ගෙවීම් කරනු ලබන විටෙක, විකිණීමේ අනුපාත කාලපරිච්ඡේදය සම්බන්ධයෙන් වූ සාමාන්‍ය භාවිතා කළ යුතු ය.

ක්‍රියාකරුගේ බදු ප්‍රමාණය.

**22**. (1) ක්‍රියාකරු බද්ද 2003 මාර්තු මස 3 වන දින පටන් බලපවත්වන පරිදි ගෙවනු ලැබිය යුතු අතර, එක් එක් එන හා යන ජාත්‍යන්තර ඇමතුම පවත්නා කාලය මත, බලපත්‍රලාභියකු වන ක්‍රියාකරුවකුගේ සහාය ඇතිව, නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් අනුප්‍රමාණවලට අනුව ගණන් බැලිය යුතු ය :

එසේ වුව ද, අමාත්‍යවරයා විසින්-

(අ) ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බලපත්‍රලාභීන් බහුතරයක් විසින් අනුප්‍රමාණ සමාලෝචනය කිරීමක් ඉල්ලමින් තමා වෙත කරන ලද ලිඛිත නියෝජන වෙතොත්, ඒවා ; හෝ

(ආ) දේශීය සහ ජාත්‍යන්තර විදුලි සංදේශ වෙළෙඳ පොලේ පවතින තත්ත්වයන්,

සැලකිල්ලට ගනිමින්, මේ වගන්තිය ප්‍රකාර සාදන ලද යම් නියෝගයක දක්වා ඇති අනුප්‍රමාණය කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

(2) 2003 මාර්තුමස 3 වන දිනෙන් ආරම්භ වී 2004 මාර්තු මස 31 වන දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා ගෙවිය යුතු, ක්‍රියාකරුගේ බදු මුදල, මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට මාසයක කාලසීමාවක් ඇතුළත කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

(3) 2004 අප්‍රේල් මස 01 වන දිනෙන් ආරම්භ වන එක් එක් මාසය සඳහා ගෙවිය යුතු, ක්‍රියාකරුගේ බද්ද, එක් එක් මාසය අවසානයේ සිට වැඩකරන දින තිහක් ඇතුළත, කොමිෂන් සභාව විසින් සඳහන් කරනු ලැබිය හැකි විස්තර කිසිවක් ද සමඟ කොමිෂන් සභාව වෙත ගෙවනු ලැබිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ කොමිෂන් සභාව වෙත ගෙවන ලද යම් බද්දක් වැය කළ යුතු කාර්ය නියම කරන නියෝග සාදනු ලැබිය හැකි ය.

කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ නිකුත් කළ යුතු බව.

**23**. මේ පනතේ මේ කොටසේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කොමිෂන් සභාව විසින් මාර්ගෝපදේශ හා වෙනත් අවශ්‍ය උපදෙස් නිකුත් කරනු ලැබිය හැකි ය.

ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවල දී ගතයුතු ක්‍රියා මාර්ගය.

**24**. (1) 21 වන වගන්තියේ විධිවිධාන සලස්වා ඇති පරිදි යම් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවකු විසින් සපයන ලද සේවාවන්ගේ අගය මත අයවිය යුතු මුළු බදු ප්‍රමාණය ගෙවීමට අපොහොසත්වන ඒ ක්‍රියාකරු පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපතිවරයා, යම් අධ්‍යක්ෂවරයකු හෝ ප්‍රධාන නිලධරයා, මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා පැහැර හරින්නකු වශයෙන් සලකනු ලැබිය යුතු ය. තව ද, නියමිත දින හෝ ඊට පෙර නොගෙවූ ඒ බද්ද, පැහැරහරින ලද බද්දක් වශයෙන් සලකනු ලැබිය යුතු ය.

(2) පැහැර හැර ඇති බද්දට අතිරේකව,—

(අ) මාස එකක හෝ ඉන් කොටසක කාලපරිච්ඡේදයක් සඳහා, පැහැර හැර ඇති ඒ බදු මුදලින් සියයට දහය බැගින් ; සහ

(ආ) මාස එකක හෝ ඉන් කොටසක එක් එක් පසු කාලපරිච්ඡේදයක් සඳහා, පැහැර හැර ඇති ඒ බදු මුදලින් සියයට දෙක බැගින්,

කොමිෂන් සභාව විසින් එකතු කරනු ලැබිය යුතු ගණන් බලන ලද අධිභාරයක් ගෙවීමට පැහැර හරින්නා බැඳී සිටිය යුතු ය.

(3) මාස තුනකට වැඩි වූ කාලපරිච්ඡේදයක් සඳහා පැහැර හරිනු ලැබ ඇති යම් බද්දක්, ඒ මත එකතු වූ අධිභාරය ද සමග මින්පසු සඳහන් කරනු ලබන ආකාරයට අයකර ගැනීම සඳහා කොමිෂන් සභාව විසින් ක්‍රියා කරනු ලැබිය යුතු ය.

(4) පැහැර හැර ඇති බද්ද, ඒ මත එකතු වූ අධිභාර මුදල ද සමඟ අයකර ගැනීම සඳහා පියවර කිසිවක් ගැනීමට සති තුනකට පෙරාතුව, මේ වගන්තියේ විධිවිධාන ප්‍රකාර, පැහැර හැර ඇති බදු මුදල අයකරගැනීම සඳහා නඩු පැවරීමට කොමිෂන් සභාව අදහස් කරන බව පැහැර හරින්නා වෙත දැනුම් දෙමින් කොමිෂන් සභාව විසින් පැහැර හරින්නා වෙත දැන්වීමක් නිකුත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.

(5) (4) වන උපවගන්තිය ප්‍රකාර පැහැර හරින්නා වෙත දැන්වීම නිකුත් කරනු ලැබ, ඒ දැන්වීමේ සඳහන් සති තුනක කාලපරිච්ඡේදය ඉකුත් වී ඇති නමුත්, අධිභාරය සමග වූ පැහැර හැර ඇති මුදල නොගෙවනු ලැබ ඇති අවස්ථාවක, පැහැර හරින්නා වාසය කරන්නා වූ හෝ ව්‍යාපාරය කර ගෙන යන්නා වූ කොට්ඨාසය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇත්තා වූ මහෙස්ත්‍රාත්වරයා වෙත, පැහැර හරින්නාගේ නම සහ ලිපිනය සහ පැහැර හැර ඇති මුළු මුදල ඇතුලත් සහතිකයක්, මේ වගන්තිය මගින් නියමිත ගෙවීම් කිරීම, එසේ නම් කරන ලද තැනැත්තා විසින් පැහැර හැර ඇති බවට වූ ප්‍රකාශයක් ද සමඟ කොමිෂන් සභාව විසින් සභාපතිගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබිය යුතු ය. පැහැර හරින්නා සංස්ථාගත මණ්ඩලයක් වන අවස්ථාවක, ඒ සංස්ථාගත මණ්ඩලයේ සභාපතිගේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ හා සෑම අධ්‍යක්ෂවරයකුගේ ම නම සහතිකයේ ඇතුළත් විය යුතු ය.

(6) (5) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකය ලැබුන විට, නියම කරනු ලබන යම් දිනයක තමා ඉදිරියේ පෙනී සිට, පැහැර හරින ලද බදු මුදල, ඒ මත එකතු වූ අධිභාරය ද සමඟ අයකර ගැනීම සඳහා නීත්‍යානුකූලව ක්‍රියා නොකළ යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙසට නියම කරමින්, මහෙස්ත්‍රාත්වරයා විසින් පැහැර හරින්නා වෙත සිතාසි නිකුත් කරනු ලැබිය යුතු ය. දක්වන ලද හේතුව, නොගෙවීමේ හේතුව පැහැදිලි කිරීම සඳහා ප්‍රමාණවත් නොවේයැයි මහෙස්ත්‍රාත්වරයාට පෙනී යන අවස්ථාවක මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ බව සටහන් කර ගැනීමෙන් පසුව, පැහැර හරින ලද බදු මුදල, ඒ මත එකතු වූ අධිභාරය ද සමග මහෙස්ත්‍රාත්වරයා විසින් පනවන ලද දඩයක් මෙන් සළකා පැහැර හරින්නාගෙන් අයකර ගැනීම සඳහා ආඥා කරනු ලැබිය යුතු ය. එසේ අයකර ගනු ලැබූ මුදල් කොමිෂන් සභාව වෙත ප්‍රේෂණය කර, එම මුදල ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**25**. (1) (අ) මේ පනතේ මේ කොටසේ විධිවිධාන අතුරෙන් යම් විධිවිධානයකට හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයකට අනුකූලව කටයුතු කිරීම කඩකරන හෝ පැහැර හරින ; සහ

(ආ) මේ කොටස යටතේ දෙන ලද හෝ සාදන ලද යම් විධානයකට හෝ නියමයකට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින ;

(ඇ) මේ පනත ප්‍රකාර තොරතුරු සැපයීමේ යම් නියමයක් යටතේ දැන දැනම යම් වැරදි තොරතුරක් සපයන හෝ සැපයීමට සලස්වන,

සෑම බලපත්‍රලාභියකුම, වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ මාස හයකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් අකාරයක බන්ධනාගාරගත කිරීමකට, නැතහොත් ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම යටත් විය යුතු ය.

(2) මේ පනතේ මේ කොටස යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලැබූ අවස්ථාවක,—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වේ නම්, ඒ සංස්ථාගත මණ්ඩලයේ සෑම අධ්‍යක්ෂවරයකු හෝ නිලධරයකු ම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම කොටස් කරුවෙක් ම,

ඒ වරදට වරදකරු විය යුතු ය:

එසේ වුව ද, ඒ වරද තමාගේ දැනීමක් නොමැතිව කරන ලදැයි ද, නැතහොත් ඒ වරද කිරීම වළක්වාලීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියාකර ඇතැයිද ඔප්පු කරනු ලැබුවහොත්, ඒ සංස්ථාගත මණ්ඩලයේ ඒ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා, නැතහොත් ඒ ව්‍යාපාරිකයා ආයතනයේ කොටස්කරු ඒ වරදට වරදකරු නොවිය යුතු ය.

නියෝග. **26**. (1) මේ පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා සහ නියෝග සෑදීමට මේ පනතින් බලය දී ඇති හෝ නියෝග සෑදිය යුතු යයි මේ පනතින් නියමිත යම් කාරණා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, පහත සඳහන් කාරණා සියල්ලම සඳහා හෝ ඉන් කිසිවක් සඳහා හෝ නියෝග සාදනු ලැබිය හැකි ය.

(අ) කොමිෂන් සභාව වෙත ගෙවන ලද යම් බද්දක් වැය කළ යුතු ආකාරය සහ ක්‍රමය.

(ආ) කොමිෂන් සභාව වෙත ගෙවන ලද යම් බද්දක් වැය කළ යුතු කාර්යය.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරන ලද දිනයේ පටන් ක්‍රියාත්මක විය යුතු ය ; නැතහොත් එහි නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියෝගයක්ම හැකිතාක් ඉක්මණින් පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එහි අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ ඊට කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව අනනුමත කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(5) යම් නියෝගයක් අනනුමත කරනු ලැබූ දිනය ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**27**. (1) මේ පනතේ මේ කොටසේ විධිවිධාන, 2003 මාර්තු මස 3 වන දින ක්‍රියාත්මක වූ ලෙස සියලු කාර්ය සඳහා සලකනු ලැබිය යුතු ය.

මේ කොටස ක්‍රියාත්මක වන දිනය.

(2) 2003 මාර්තු මස 3 වන දිනයෙන් ආරම්භව, මේ පනත ආරම්භවන දිනයෙන් අවසාන වන කාලපරිච්ඡේදය තුළ දී, යම් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවකු විසින් යම් පාවිච්චි කරන්නෙකුගෙන් අයකර, එකතු කරගන්නා ලද බදු මුදල වලංගු ලෙස අයකර ගන්නා ලදැයි සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද එකතු කිරීම සම්බන්ධයෙන් යම් සිවිල් හෝ අපරාධ නඩුවක් පැවරීමෙන් ඒ ක්‍රියාකරු මෙයින් ආරක්ෂා කරනු ලැබේ.

සැක දුරු කිරීම.

**28**. මේ කොටසේ විධිවිධාන අදාළවන යම් ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරුවකු—

(අ) 2003 මාර්තු 3 වන දිනෙන් ආරම්භව 2004 මාර්තු 31 වන දිනෙන් අවසන් වන කාලසීමාව වෙනුවෙන්, ඉහත සඳහන් වගන්තියට අනුව, ඔහු විසින් ඇත්ත වශයෙන් ම ගෙවා තිබෙන එක්සත් ජනපද ඩොලර් ශත හතකුත් දශම දෙක (7.2) සහ ඔහු විසින් ගෙවනු ලැබිය යුතු එක්සත් ජනපද ඩොලර් ශත එකොළහ (11) අතර වෙනස ගෙවුවහොත් ; සහ

(ආ) 2004 අප්‍රේල් 1 වන දිනෙන් ආරම්භ වන දෙවන වර්ෂය සහ මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනය දක්වා ඉහත සඳහන් වගන්තිය අනුව ඔහු විසින් ඇත්ත වශයෙන් ගෙවා තිබෙන එක්සත් ජනපද ඩොලර් ශත පහකුත් දශම දෙක (5.2) සහ ඔහු විසින් ගෙවනු ලැබිය යුතු එක්සත් ජනපද ඩොලර් ශත නවය (9) අතර වෙනස ගෙවුවහොත්,

ඔහු 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ, අවස්ථාවෝචිත පරිදි (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන අනුව ක්‍රියාකර ඇති ලෙස සැලකිය යුතු බව, සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

## IV වන කොටස

## 2003 අංක 25 දරන මුදල් පනතට කරනු ලබන සංශෝධන

2003 අංක 25 දරන මුදල් පනතේ (II) වන කොටසේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම.

**29**. 2003 අංක 25 දරන මුදල් පනතේ (II) වන කොටසේ 11 වන වගන්තියේ “සංචාරක සංවර්ධන බද්ද යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු” යන වචන වෙනුවට, “සංචාරක සංවර්ධන බද්ද” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය :

එසේ වුව ද, 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනත යටතේ සංචාරක අනුයෝජිතයෙකු වශයෙන් බලපත්‍රලත් යම් සාමාන්‍ය අලෙවි අනුයෝජිතයකු හෝ පිරිවැටුම මත, 2004 ජනවාරි මස 1 වන දින පටන් ඒ බද්ද අයකරනු නොලැබිය යුතු ය.” යන වචන ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

පනතේ මේ කොටස ක්‍රියාත්මකවන දිනය.

**30**. මේ පනතේ මේ කොටසේ විධිවිධාන, 2004 ජනවාරි මස 1 වන දින පටන් ක්‍රියාත්මක වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

**31**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත් විය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය (2(1) වගන්තිය)

| යටත්වන පිරිවැටුමේ කොටස | ඒ කොටසට අදාළවන සේවා ගාස්තු අනුප්‍රමාණය |
|---|---|
| 1. ලාභ සහ ආදායම ආදායම් බද්දෙන් නිදහස් කෙරෙන යම වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ ලැබෙන පිරිවැටුමේ ඇතුළත්වන පරිදි යටත්වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.25 |
| 2. ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ගිවිසුමකට එළඹ ඇති යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ ලැබෙන පිරිවැටුමේ ඇතුළත්වන පරිදි යටත්වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.25 |
| 3. දේශීය ආදායම් පනතේ හයවන උපලේඛනයේ සඳහන් යම් අනුප්‍රමාණයකට අනුව ආදායම් බදු අයකළහැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ ලැබෙන පිරිවැටුමේ ඇතුළත්වන පරිදි යටත්වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 0.5 |
| 4. දේශීය ආදායම් පනතේ හයවන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණයක් නොවන යම් අනුප්‍රමාණයකට අනුව ආදායම් බදු අයකළහැකි යම් වෙළෙඳාමකින්, ව්‍යාපාරයකින්, වෘත්තියකින්, රක්ෂාවකින් හෝ ලැබෙන පිරිවැටුමේ ඇතුළත්වන පරිදි යටත්වන පිරිවැටුමේ යම් කොටසක්. | සියයට 1.0 |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.